**මාධ්‍ය ආයතනවල ප්‍රධාන කර්තෘතුමා/කර්තෘතුමිය වෙත,**

**පාසල්වල වර්ණ ප්‍රදානෝත්සව (Colours Awarding Ceremony) පැවැත්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිර්දේශය පිළිබඳ ජනතාව දැනුවත් කිරීම සඳහා සිදුකෙරෙන කාරුණික ඉල්ලීම**

**ගරු ප්‍රධාන කර්තෘතුමා/කර්තෘතුමිය,**

පාසල් ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ සාධාරණත්වය, සමානාත්මතාවය, දරුවන්ගේ අයිතිවාසිකම් හා යහපාලන මූලධර්ම තහවුරු කිරීම සඳහා ඉතා වැදගත් වන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති නිර්දේශය පිළිබඳව ඔබගේ ගෞරවනීය මාධ්‍ය ආයතනයේ අවධානය යොමු කිරීමට කැමැත්තෙමි.

2025 දෙසැම්බර් 30 දින මාතර, රාහුල විද්‍යාලය විසින් සංවිධානය කරන ලද වර්ණ ප්‍රදානෝත්සවයේදී දක්ෂතම ක්‍රීඩකයා තෝරාගැනීම සඳහා අනුගමනය කරන ලද ක්‍රියාපටිපාටිය සම්බන්ධයෙන් මා විසින් ගොනු කරන ලද HRC/HO/15/26 දරණ පැමිණිල්ල ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් විමර්ශනය කර එහි තීරණය 2026 අගෝස්තු 20 දින මා වෙත දන්වා ඇත. එම තීරණයේ පිටපත් ගරු අධ්‍යාපන අමාත්‍යතුමිය සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමා වෙත ද යොමු කර ඇත (ඇමුණුම 1).

මෙම තීරණය, එක් පාසලකට පමණක් සීමා නොවන අතර, සමස්ත පාසල් පද්ධතියටම බලපාන ජාතික වැදගත්කමක් ඇති නිර්දේශ රැසක් සහිත වූවකි.

**මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රධාන නිර්දේශ පහත පරිදි වේ;**

1) පාසල්වල වර්ණ ප්‍රදානෝත්සව සංවිධානය කිරීම සහ පැවැත්වීමේදී අනුගමනය කළ යුතු ජාතික මට්ටමේ පොදු විධිවිධාන මාලාවක් හෝ නියාමන මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කර ක්‍රියාත්මක කල යුතු බවට අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිර්දේශ කර ඇත.
2) මින් ඉදිරියට මාතර රාහුල විද්‍යාලය විසින් වර්ණ ප්‍රදානෝත්සව පැවැත්වීමේදී සියළුම ක්‍රීඩකයන් වෙත සාමානාත්මතාවය සහ සාධාරණත්වය තහවරු වන පරිදි, විනිවිදභාවයෙන් යුතු සහ කුසලතා මත පදනම් වූ විධිමත් නිර්ණායකයන්ගෙන්

සමන්විත ක්‍රමවේදයක් සකස් කර අනුගමනය කළ යුතු අතර, එය ක්‍රියාත්මක කිරීමට පෙර අධ්‍යාපන අමාත්‍යාංශයේ පූර්ව අනුමැතිය ලබාගත යුතු බව නිර්දේශ කර ඇත.

එමෙන්ම, මානව හිමිකම් කොමිෂන් සභාව තම නිරීක්ෂණ මත පහත සඳහන් වැදගත් නිගමනවලට එළඹ ඇත.

1) ඔලිම්පික් තරඟ සඳහා අනුමත ක්‍රීඩාවන්ට ප්‍රමුඛතාවය ලබාදීම සහ චෙස් වැනි ඔලිම්පික් තරඟ සඳහා අනුමත නොවන ක්‍රීඩාවන් වෙනස් කොට සැලකීමක් (Discrimination) සිදුකිරීම මගින්, රාහුල විද්‍යාලය, ක්‍රීඩාවක නිරත වීම සෑම දරුවෙකුගේම අයිතිවාසිකමක් බව පිළිගන්නා එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් සම්මුතියේ (UN Convention on the Rights of the Child) 31 වන ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති ජාත්‍යන්තරව පිළිගත් මූලික ළමා අයිතිවාසිකම් සහ ආරක්ෂණය නොසළකා කටයුතු කර ඇති බව කොමිෂන් සභාව ප්‍රකාශ කර ඇත.
2) අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 35/2020 දරන චක්‍රලේඛය අනුව පාසල් සඳහා නිර්දේශ කර ඇති ක්‍රීඩා 32 ටම සමාන පිළිගැනීමක් ලබාදී තිබියදී සහ කිසිදු ක්‍රීඩාවකට ප්‍රමුඛතාවයක් ලබාදී නොතිබියදී, රාහුල විද්‍යාලය ඔලිම්පික් ක්‍රීඩාවන්ට පමණක් ප්‍රමුඛතාව ලබාදීම මගින් එම චක්‍රලේඛයේ විධිවිධාන අභිබවා යමින් කටයුතු කර ඇති බව කොමිෂන් සභාව පෙන්වා දී ඇත.
3) 1973 අංක 25 දරන ක්‍රීඩා පනත ප්‍රකාරව 2025 මැයි 21 දින නිකුත් කරන ලද ජාතික ක්‍රීඩා සංගම් නියෝග (අතිවිශේෂ ගැසට් අංක 2437/24) නියෝග මගින් කිසිඳු ක්‍රීඩාවක් අතර විභේදනයක් ඇතිකර නොමැතිව තිබියදී රාහුල විද්‍යාලය විසින් චෙස් ක්‍රීඩාව නොසලකා හැර ඇති බවද එය රටේ පවතින විධායක සහ ව්‍යවස්ථාපිත ක්‍රීඩා නීතියට පටහැනි බවද කොමිෂන් සභාව සඳහන් කර ඇත.
4) ක්‍රීඩාවන් අතර අත්තනෝමතික විභේදනයක් ඇතිකරමින් නිර්ණායක සකස් කර චෙස් ක්‍රීඩාව වැනි ඔලිම්පික් නොවන ක්‍රීඩා අඩු තක්සේරුවකට ලක්කිරීම මගින් සමානාත්මතාවය සහ නීතියේ සමාන ආරක්ෂණය ලැබීමේ මූලික අයිතිවාසිකම්, රාහුල විද්‍යාලය විසින් ඔලිම්පික් නොවන වෙනත් ක්‍රීඩාවල නිරතවන දරුවන්ට අහිමිකර කටයුතු කර ඇති බවද කොමිෂන් සභාව සඳහන් කර ඇත.

තවද, Haputhanthirige and Others v. Attorney General නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රකාශ කළ පරිදි, ක්‍රීඩා සම්බන්ද යම් වර්ගීකරණයක් ද අත්තනෝමතික හෝ අසාධාරණ නොවිය යුතු අතර, එය සාධාරණ සහ සැබෑ පදනමක් මත සිදුකළ එකක් විය යුතු බව කොමිෂන් සභාව සිය තීරණයේදී අවධාරණය කර ඇත.

මෙම සිද්ධියේ වින්දිතයා වන දිනුජය කොඩිතුවක්කු ශිෂ්‍යයා 2024 වර්ෂයේ ශ්‍රී ලංකා ජාතික චෙස් කණ්ඩායමේ සාමාජිකයෙකු ලෙස ජාත්‍යන්තර චෙස් තරගාවලි හයකට සහභාගි වී රන්, රිදී සහ ලෝකඩ පදක්කම් දිනාගෙන ඇත. එමෙන්ම ඔහු ශ්‍රී ලංකාවේ වසරේ විශිෂ්ටතම පාසල් චෙස් ක්‍රීඩකයා සහ වසරේ ජනප්‍රියතම චෙස් ක්‍රීඩකයා ලෙසද ඇගයීමට ලක්ව ඇත.

විශේෂයෙන්ම, රාහුල විද්‍යාලයේ සියවසකට අධික ඉතිහාසය තුළ ශ්‍රී ලංකා ජාතික චෙස් කණ්ඩායමට තේරී පත් වූ එකම ශිෂ්‍යයා වන්නේද ඔහුය.

එසේ වුවද, චෙස් ක්‍රීඩකයෙකු වීම පමණක් හේතු කරගෙන 2023/2024 වසරේ විශිෂ්ටතම ක්‍රීඩකයා සම්මානය සඳහා ඔහුගේ අයදුම්පත සලකා බැලීමට පවා කටයුතු කර නොමැත. ඔහු සම්මුඛ පරීක්ෂණයකට කැඳවා නොතිබූ අතර, අභියාචනයක් ඉදිරිපත් කිරීමටද කිසිදු අවස්ථාවක් ලබාදී නොතිබුණි.

ඒ අනුව

**2023/2024 වර්ෂයේ "වසරේ විශිෂ්ටතම ක්‍රීඩකයා" (Most Outstanding Player of the Year) සම්මානය සඳහා දිනුජය කොඩිතුවක්කු ශිෂ්‍යයාගේ අයදුම්පත සලකා නොබැලීම මඟින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) වගන්තියෙන් සහතික කර ඇති "නීතිය හමුවේ සමානාත්මතාවය සහ නීතියේ සමාන රැකවරණය ලැබීමේ" මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බව කොමිෂන් සභාව තීරණය කර ඇත.**

මෙම තීරණය, පාසල් ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ සමානාත්මතාවය, වෙනස්කොට සැලකීමෙන් තොරව කටයුතු කිරීම, දරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ කුසලතා සාධාරණ ලෙස ඇගයීම සම්බන්ධයෙන් ඉතා වැදගත් පූර්වාදර්ශයක් සපයයි. එබැවින් මෙය සිසුන්, දෙමාපියන්, ගුරුවරුන්, ක්‍රීඩා පරිපාලකයින් සහ ප්‍රතිපත්ති සම්පාදකයින් ඇතුළු සමස්ත සමාජයටම වැදගත් මහජන උනන්දුවක් ඇති කරුණකි.

ඒ අනුව, මෙම ඓතිහාසික තීරණය පිළිබඳව මහජනතාව දැනුවත් වන පරිදි ඔබගේ ගෞරවනීය මාධ්‍ය ආයතනය හරහා පුළුල් ප්‍රචාරයක් ලබාදෙන ලෙස ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිමි. එවැනි ප්‍රචාරයක් මඟින් රටේ සියලුම පාසල්වල වඩාත් සාධාරණ, විනිවිදභාවයෙන් යුතු සහ සමානාත්මක ඇගයීම් ක්‍රමවේදයන් ස්ථාපිත කිරීමට ද වැදගත් දායකත්වයක් ලැබෙනු ඇත.

මෙම ඉල්ලීම කෙරෙහි ඔබතුමාගේ/ඔබතුමියගේ කාරුණික අවධානය යොමු කිරීම පිළිබඳව ස්තුතිවන්ත වෙමි.

මෙයට විශ්වාසී,

**මහාචාර්ය කේ. කේ. අයි. යූ. අරුණ කුමාර**

**පැමිණිලිකරු**

**පැමිණිලි අංකය: HRC/HO/15/26**

Email: kkiuaruna@crop.ruh.ac.lk

Mobile: 0718116304

## Recommendations of Human Rights Commission of Sri Lanka on conducting Colours Awarding Ceremonies in Schools

Dear Editor,

I respectfully seek your kind assistance in bringing to the attention of the public **an important decision recently delivered by the Human Rights Commission of Sri Lanka (HRCSL), which has significant implications for the protection of children's rights, equality, and fairness in school sports across the country**.

The Human Rights Commission of Sri Lanka concluded its inquiry into Complaint No. HRC/HO/15/26, which I lodged concerning the Colours Awarding Ceremony of Rahula College, Matara, held on 30 December 2025. The Commission communicated its determination to me on 20 August 2026, with copies forwarded to the Hon. Minister of Education and the Secretary, Ministry of Education (Annex 1).

The findings and recommendations of the Commission extend well beyond a single school and have important national relevance. Among its principal recommendations are:

> 1) The Ministry of Education has been directed to **formulate uniform rules, regulations, and a common regulatory mechanism applicable to all schools** when conducting Colours Awarding Ceremonies.
>
> 2) Rahula College, Matara has been directed **to establish a fair, transparent, and merit-based evaluation system for the selection of award recipients** and to obtain prior approval from the Ministry of Education before implementing such a system.

More importantly, the Human Rights Commission has determined that:

1) Rahula College discriminated against Chess as a recognized sport. The actions of the school were inconsistent with Article 31 of the United Nations Convention on the

Rights of the Child, which recognizes every child's right to participate in sports and recreational activities.

2) The College acted contrary to Ministry of Education Circular No. 35/2020, which recognizes 32 school sports without giving priority to any particular sport. The Commission found that giving preference only to Olympic sports was inconsistent with the Circular and unfairly disadvantaged chess players.
3) The College also failed to comply with the provisions of Gazette Extraordinary No. 2437/24 of 21 May 2025, issued under the Sports Act No. 25 of 1973, which recognizes 73 sports with equal status.
4) The Commission further referred to the judgment of the Supreme Court of Sri Lanka in Haputhanthirige and Others v. Attorney General, reiterating that any classification must be reasonable, non-arbitrary, and based on real and substantial distinctions.

The victim, Dinujaya Kodithuwakku, is an outstanding young sportsman who represented Sri Lanka as a member of the National Chess Team in 2024. During that period, he won Gold, Silver, and Bronze medals at six international chess competitions. He was also recognized as the Most Outstanding School Chess Player of the Year and the Most Popular Chess Player in Sri Lanka. Notably, he is the first student in the more than 100-year history of Rahula College to be selected to the National Chess Team.

Despite these exceptional achievements, his application for the Most Outstanding Player of the Year 2023/24 was not even considered because he was a chess player. He was not invited for an interview, nor was he afforded any opportunity to appeal.

Accordingly, the Human Right Commission determined that

**The failure to consider Dinujaya Kodithuwakku for the Most Outstanding Player of the Year 2023/24 constituted a violation of his fundamental right to equality guaranteed under Article 12(1) of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka.**

**This determination by the Human Rights Commission establishes important principles relating to equality, non-discrimination, children's rights, and fair recognition of sporting excellence in schools. It is a matter of considerable public interest, particularly for students, parents, educators, sports administrators, and policymakers**.

I would therefore be most grateful if your esteemed media institution could provide appropriate publicity to this **landmark decision** so that the wider public may be informed and meaningful reforms may be encouraged throughout the school system.

Thank you for your kind consideration and your continued commitment to promoting public awareness on matters of national importance.

Yours faithfully,

Prof. K. K. I. U. Aruna Kumara

Complainant

Complaint No. HRC/HO/15/26

Email: kkiuaruna@crop.ruh.ac.lk

Mobile: 0718116304